# පුරප්පාඩු

## ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු බඳවා ගැනීම

## GCF නකල්ස් ව්‍යාපෘතිය

**ශ්‍රී ලංකාවේ නකල්ස් කඳුවැටියේ යැපුම් ගොවීන්ගේ සහ කෘෂිකාර්මික වැවිලි ප්‍රජාවන්ගේ දේශගුණික අව බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම.**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (MSD) චක්‍රලේඛ අංක 01/2019 සහ GCF නකල්ස් ව්‍යාපෘතිය සඳහා රජයේ බඳවා ගැනීමේ ක්‍රියා පටිපාටිවලට අනුව " පූර්ණ කාලීන - කොන්ත්‍රාත් පදනම මත" ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලත් සහ කැපවූ ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ . මූලික වශයෙන් හරිත දේශගුණික අරමුදල (GCF) විසින් ඇමරිකානු ඩොලර් මිලියන 39.7 ක දායකත්වයක් සහ දේශීය මූලාශ්‍රවලින් අතිරේක ඇමරිකානු ඩොලර් මිලියන 9.2 ක දායකත්වයක් ලබා දෙන මෙම ව්‍යාපෘතිය 2029.01.16 වන දින දක්වා දිස්ත්‍රික්ක පහක් පුරා ක්‍රියාත්මක වීමට නියමිතය.

තනතුරේ වැටුප 2019/03/05 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ 01/2019 හි 03 වන වගුවේ 02 වන තීරුව අනුව වන අතර අයදුම්කරුවන් වයස අවුරුදු 62 ට අඩු විය යුතුය.

ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය මෙන්ම රජයේ රෙගුලාසි පිළිබඳ හුරුපුරුදුකම සහ ශ්‍රී ලංකාවේ විදේශ අරමුදල් සහිත ව්‍යාපෘතිවල සේවා පළපුරුද්ද සහ **අදාළ ක්ෂේත්‍රයේ සේවා පළපුරුද්ද** අමතර සුදුසුකමක් වනු ඇත.

| අනු අංක | PS කාණ්ඩය | තනතුර | තනතුරු ගණන | අදාළ චක්‍රලේඛය |
|---|---|---|---|---|
| 01 | PS 1 | ව්‍යාපෘති අධ්‍යක්ෂක | 01 | MSD චක්‍රලේඛය 1/2019 |

වැඩිදුර තොරතුරු සඳහා, වෙබ් අඩවියට පිවිසෙන්න - www.irrigationmin.gov.lk
(ඉහත සඳහන් චක්‍රලේඛය බැලීමට කරුණාකර මුදල් අමාත්‍යාංශයේ වෙබ් අඩවිය බලන්න)

**2025 ඔක්තෝබර් 17 වන දින හෝ ඊට පෙර** ලියාපදිංචි තැපෑලෙන් පහත දක්වා ඇති ලිපිනයට අයදුම්පත් යොමු කළ යුතු අතර, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**ලේකම්**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය (වාරිමාර්ග අංශය),
10 වන මහල, අංක 500,
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
ටී.බී. ජයා මාවත, කොළඹ - 10.

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලැබේ. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර, එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**ලේකම්,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
දිනය 2025.09.28

# පුරප්පාඩු

## ව්‍යාපෘති අධ්‍යක්ෂවරයෙකු බඳවා ගැනීම

## GCF නකල්ස් ව්‍යාපෘතිය

**ශ්‍රී ලංකාවේ නකල්ස් කඳුවැටියේ යැපුම් ගොවීන්ගේ සහ කෘෂිකාර්මික වැව්ලි ප්‍රජාවන්ගේ දේශගුණික අව බලපෑම්වලට ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම.**

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

**ව්‍යාපෘති කාලය අවුරුදු 05 (2029.01.16 දක්වා)**

දේශගුණික අව බලපෑම්වලට එරෙහිව නකල්ස් කඳුවැටි ප්‍රදේශයේ කෘෂිකර්ම, ග්‍රාමීය සහ වතු ප්‍රජාවන්ගේ දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීමේ අරමුණින්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරන ලද GCF නකල්ස් ව්‍යාපෘතිය, එහි ව්‍යාපෘති ප්‍රදේශය තුළ තිරසාර ඉඩම් කළමනාකරණය ප්‍රවර්ධනය කිරීමට කැපවී සිටී.

ඉහත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම ව්‍යාපෘතිය මාතලේ, මහනුවර , කුරුණෑගල, පුත්තලම සහ අනුරාධපුර දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 46 ක ක්‍රියාත්මක වන අතර මධ්‍යම, උතුරු මැද සහ වයඹ පළාත්වල තීරණාත්මක ජල පෝෂක ප්‍රදේශ, ගංගා සහ කෘෂිකාර්මික ප්‍රජාවන් ආවරණය කරයි. මෙම ව්‍යාපෘතිය තිරසාර ඉඩම් සහ ජල කළමනාකරණ පිළිවෙත් වැඩිදියුණු කිරීම, නව්‍ය මූල්‍යකරණ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම සහ දිගුකාලීන තිරසාරභාවය සඳහා ආයතනික හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා දායක වේ. මෙය GCF, ICRAF සහ IUCN වැනි ප්‍රධාන කොටස්කරුවන් සමඟ සහ බොහෝ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන සමඟ සහයෝගයෙන් සිදු කෙරේ.

ප්‍රධාන වශයෙන් හරිත දේශගුණික අරමුදල (GCF) විසින් ඇමරිකානු ඩොලර් මිලියන 39.7 ක දායකත්වයක් සහ දේශීය මූලාශ්‍රවලින් අතිරේක ඇමරිකානු ඩොලර් මිලියන 9.2 ක දායකත්වයක් ලබා දෙන මෙම ව්‍යාපෘතිය දිස්ත්‍රික්ක පහක් පුරා ක්‍රියාත්මක කිරීමට නියමිතය.

මෙම ව්‍යාපෘතිය සඳහා ඉහත දක්වන පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙය දිස්ත්‍රික්ක මට්ටමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ඒකක තුනක් තුළ ක්‍රියාත්මක කෙරේ. බඳවා ගැනීම් කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරෙන අතර කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2019 අනුව ගෙවීම් සිදු කෙරේ.

## 01. ව්‍යාපෘති අධ්‍යක්ෂ (PS1) – පුරප්පාඩු 01

**අවශ්‍ය සුදුසුකම් සහ පළපුරුද්ද**
**I හෝ II හෝ III පහතින්**

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව සම්පූර්ණ කරන ලද උපාධියක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්;

**සහ**

කළමනාකරණ මට්ටමින් සුදුසුකම් ලැබීමෙන් පසු අවම වශයෙන් අවුරුදු 10 ක පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් අවුරුදු 05 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය;

II. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව සම්පූර්ණ කරන ලද උපාධියක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආශ්‍රිත සාමාජිකත්වයක්/ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්;

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික / වරලත් සාමාජිකත්වයක් හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක් හෝ අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්;

**සමග**

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 08 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් තිබිය යුතු අතර, ඉන් අවුරුදු 04 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්ව මට්ටමේ විය යුතුය;

III. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, අදාළ ක්ෂේත්‍රයේ සාර්ථකව සම්පූර්ණ කරන ලද උපාධියක්;

**හෝ**

අදාළ ක්ෂේත්‍රයේ උපාධියට සමාන සුදුසුකමක් ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් සුදුසුකමක්;

**සහ**

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්;

**සමග**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් ආයතනික/වරලත් සාමාජිකත්වය හෝ ඒ හා සමාන වෘත්තීය සුදුසුකමක්;

**සමග**

කළමනාකරණ මට්ටමේ අවම වශයෙන් අවුරුදු 06 ක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද. ඉන් අවුරුදු 03 ක් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ විය යුතුය;

වැටුප් මට්ටම: **PS 1 – රු. 150,000.00 – 170,000.00** *(MSD චක්‍රලේඛ අංක: 01/2019 අනුව)*

**සාමාන්‍ය කොන්දේසි**

1. **වයස:** අයදුම්කරුවන්ගේ **වයස අවුරුදු 62** ට නොවැඩි විය යුතුය .
2. **වැටුප් පරිමාණය:** කළමනාකරණ සේවා චක්‍රලේඛයට අනුව දීමනා සහිත රජය අනුමත වැටුප් පරිමාණය. 2019/03/15 දිනැති අංක 01/2019.
3. මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත, මුලින් වසර 01 ක කාලයක් සඳහා බඳවා ගනු ලබන අතර, කාර්ය සාධනය පදනම්ව දීර්ඝ කිරීමේ හැකියාව සලකා බලනු ලැබේ.

**5. අයදුම්පත් යොමු කිරීම:**

අයදුම්කරුවන් තම අධ්‍යාපනික, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද ඇතුළත් අයදුම්පත්, ඥාතීන් නොවන නිර්දේශකයින්ගේ සම්බන්ධතා තොරතුරු දෙකක් සමඟ ඉදිරිපත් කළ යුතුය. ඉහළම සුදුසුකම් සහ පළපුරුද්ද මත පදනම්ව කෙටි ලැයිස්තුගත කර ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයක් සඳහා කැඳවනු ලබන අතර, කුසලතා මත පදනම්ව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ. සහතිකවල සහතික කළ පිටපත්, අයදුම්පත සමඟ අමුණා තිබිය යුතුය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඕනෑම ආකාරයකින් බලපෑම් කිරීම නුසුදුසුකමක් වන අතර එවැනි අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**2025 ඔක්තෝබර් 17** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **“ ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය (වාරිමාර්ග අංශය), 10** වන මහල, අංක **500,** ටී.බී. ජයා මාවත, කොළඹ **- 10.”** යන ලිපිනයට අයදුම්පත් යොමු කල යුතු අතර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කල යුතුය.

**ලේකම්**
**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**